# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1799/30 – 2013 මාර්තු 01 වැනි සිකුරාදා – 2013.03.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 71 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්.එස්/76.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: අම්/ඉ/2/7/27.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අම්බලන්තොට.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ රිදියගම (අ.ග.පි. 564) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/ඒඑම්බී/2012/623 හා 2012.12.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.4553ක් පමණ වන රිදියගම ගමේ වාරිමාර්ග ඉඩම නොහොත් රජයේ ඉඩම නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රිදියගම ගමේ වාරිමාර්ග ඉඩම නොහොත් රජයේ ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.4553ක් පමණ**

උතුරට: වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම; දකුණට සහ බටහිරට: වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම.

03 - 678

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 72 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2011/අයිආර්/188.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
එම්ටීආර්/එල්එන්ඩී/ඒඕකිව්යූඅයි/එල්1/3920.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ


1A – G 17367 – 460 (2013/03)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, දික්වැල්ල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත්සතර සුළු කොට්ඨාසයේ කැකණදුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/එම්ටීආර්/2012/74 හා 2012.06.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.3443ක් පමණ වන කොටිගල්කන්දවත්ත නමැති ඉඩම් කැබැලි දෙකට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කොටිගල්කන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0403ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: වේදත්ත ලංකා පුද්ගලික සමාගම හිමිකම් කියන කොටිගල්කන්දවත්ත; දකුණට සහ බටහිරට: ඇළ.

02. **කැබලි අක්ෂර 'බී' – කොටිගල්කන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3040ක් පමණ**

උතුරට: වේදත්ත ලංකා පුද්ගලික සමාගම හිමිකම් කියන කොටිගල්කන්දවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ වේදත්ත ලංකා පුද්ගලික සමාගම හිමිකම් කියන කොටිගල්කන්දවත්ත; දකුණට: වේදත්ත ලංකා පුද්ගලික සමාගම හිමිකම් කියන කොටිගල්කන්දවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ වේදත්ත ලංකා පුද්ගලික සමාගම හිමිකම් කියන කොටිගල්කන්දවත්ත.

03 - 679

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1745/2 හා 2012.02.13 වැනිදින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ද, 2012 අංක 14 හා 2012.02.02 දින දරන ආඥාවේ ඉඩම් කැබලි 5ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව 1745/2 හා 2012.02.13 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2012 අංක 14 හා 2012.02.02 දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් කැබලි අක්ෂර ඩී දරන ඉඩම් කොටස පමණක් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2004/එෆ්ආර්/32.
ප්‍රා.ලේකම්ගේ අංකය: ඉ/01/34/8/53.
2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය.
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරළය, උඩපත්තුව සුළු කොට්ඨාසයේ, ඉලුඹකන්ද (අ.ග.පි. 932) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ආර්/එස්එස්/කේඑල්ඩබ්ලිව්/2013/0028 හා 2013.02.05 වැනි දින දරන සංශෝධිත ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඩී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 19.5866ක් පමණ වන මෝනින්සයිඩ්වත්ත, ශාන්ත රොනාන්ස් වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඩී' – මෝනින්සයිඩ්වත්ත ශාන්ත රොනාන්ස් වත්ත – ප්‍රමාණය: හෙක්. 19.5866ක් පමණ**

උතුරට: කැබලි අංක 847, 429, කැබලි අක්ෂර සී සහ අ.ග.පි. 916 ඉත්තෑකන්ද; නැගෙනහිරට: කැබලි අංක 429, කැබලි අක්ෂර සී, අ.ග.පි. 916 ඉත්තෑකන්ද සහ කැබලි අංක 435; දකුණට: කැබලි අංක 435, කැබලි අක්ෂර ඊ සහ කැබලි අංක 847; බටහිරට: කැබලි අංක 435, කැබලි අක්ෂර ඊ, කැබලි අංක 847 සහ 429.

03 - 680

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1996 දෙසැම්බර් මස 10 වැනි දින අංක 953/6 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද 1996 අංක 310 දරන (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක මහ/එච්ආර්එස්/ඒසීකිව්/96/280 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර ඒ හා බී යන ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ

(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 13/96/ඒඑස්/4/332.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හාප/සං1/ඉඅ/47.
2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැඳුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයේ මැදසියපත්තුව සුළු කොට්ඨාසයේ රන්දිලිගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/එච්ආර්එස්/ඒසීකිව්/96/280 හා 1996.11.06 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ බී වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0790ක් පමණ වන දික්දණ්ඩාහේන නමැති ඉඩම් කොටස් දෙකට (02)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – දික්දණ්ඩාහේන – ප්‍රමාණය: හෙක්. 0.0225ක් පමණ**

උතුරට: මහාමාර්ගය සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ පාර; දකුණට: පාර; බටහිරට: මහාමාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – දික්දණ්ඩාහේන – ප්‍රමාණය: හෙක්. 0.0565ක් පමණ**

උතුරට: මහාමාර්ගය, පාර සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: ඇළ සහ පාර; බටහිරට: පාර සහ මහාමාර්ගය.

03 - 681

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2002 ඔක්තෝබර් මස 28 වැනි දින අංක 1260/3 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2002 අංක 172 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2001/එච්ඩබ්/246.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උප/3/ඉඅත්/166.
2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැඳුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පොල මහ නගර සීමාව තුළ කොට්ඨාස අංක 12 මහර යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඑම්320122 (කොටස් 6) හා 2004.09.12 දිනැති පිඹුරේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 6:192 – වරි. අංක නොදන්නා රාක්කයාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0948**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අංක 6:194; දකුණට: කැබලි අංක 6:194, 6:195 සහ 6:193; බටහිරට: කැබලි අංක 6:211, 6:208, 6:207, 6:190 සහ 6:191.

02. **කැබලි අංක 6:199 – වරි. අංක නොදන්නා රාක්කයාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0657**

උතුරට: කැබලි අංක 6:197, 6:211 සහ 6:198; නැගෙනහිරට: කැබලි අංක 6:198 සහ 6:201; දකුණට: කැබලි අංක 6:201, 6:211 සහ 6:200; බටහිරට: කැබලි අංක 6:200, 6:211, සහ 6:197.

03. **කැබලි අංක 6:207 – වරි. අංක නොදන්නා රාක්කයාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0012**

උතුරට: කැබලි අංක 6:190 සහ 6:192; නැගෙනහිරට: කැබලි අංක 6:192; දකුණට: කැබලි අංක 6:211; බටහිරට: කැබලි අංක 6:189 සහ 6:190.

04. **කැබලි අංක 6:208 – වරි. අංක නොදන්නා රාක්කයාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අංක 6:192; දකුණට: කැබලි අංක 6:192 සහ 6:211; බටහිරට: කැබලි අංක 6:211.

03 - 682

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.